**විමර්ශනාත්මක පාලි ව්‍යාකරණය**

ප්‍රථම මුද්‍රණය - 2008

© මකුරුප්පේ ධම්මානන්ද හිමි

ISBN 978-955-95597-1-9

කවර නිර්මාණය

අශාන් සියඹලාපිටිය

පරිගණක අක්ෂර සංයෝජනය

සාගර පෙරේරා

මුද්‍රණය - කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැගිරිවත්ත පාර, ගංගොඩවිල,
නුගේගොඩ.

ප්‍රකාශනය

කර්තෘගේ ප්‍රකාශනයකි

**කර්තෘගේ වෙනත් කෘති**

චින්තාවලී (ත්‍රෛභාෂාත්මක පද්‍ය කාව්‍ය)

ධම්මපද විචාරය

විමර්ශනාත්මක සිංහල ශිලාලිපි මාලා

සන්න ගැටපද විවරණ සහිත බ්‍රහ්මජාල සූත්‍රය



# පෙරවදන

ව්‍යාකරණය කවර භාෂාවක් හදාරන ශිෂ්‍යයන් අතර වුව ද ජනප්‍රිය නො වන එහෙත් අත්‍යවශ්‍යයෙන් ම හදාළ යුතු අංගයකි. ව්‍යාකරණයෙන් තොරව කිසිවෙකුට කිසිම භාෂාවක් නිවැරදිව හැසිරවිය නො හැකි ය. පාලි සංස්කෘත වැනි භාෂා විෂයෙහි මෙම ප්‍රකාශය නිශ්චිත යථාර්ථයක් බව අමුතුවෙන් කිවයුතු නොවේ. එයිනුදු ගැඹුරු දර්ශනයකින් හෙබි බුදුදහම ලියැවී ඇති ත්‍රිපිටක ග්‍රන්ථ නිවැරදිව කියවීමටත් තේරුම් ගැනීමටත් ව්‍යාකරණයේ උපයෝගිතාව පාලි වියතුන් මැනවින් දන්නා කරුණකි. ව්‍යාකරණය නො දන්නා අන්ධ හස්තියෙකු වනයෙහි පියවරක් පාසා හැපෙන්නාක් මෙන් බුදුවදන පිළිබඳව නිබඳව ම ගැටලුවලට මුහුණ පාන බව සම්ප්‍රදාය විසින් ම පිළිගෙන ඇත්තේ එහෙයිනි. මේ නිසා පාලි විෂය හදාරන නැතහොත් බුදුදහම මැනවින් හදාරනු රිසි අය විසින් පාලි ව්‍යාකරණය පිළිබඳ අවබෝධය තියුණු කර ගත යුතුම ය. විශේෂයෙන් පිරිවෙන්වල විශ්වවිද්‍යාලවල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල ඉගෙනුම ලබන භික්ෂූන් වහන්සේ ලා මේ පිළිබඳව අවදියෙන් සිටීම බුද්ධවචනයේ සුරක්ෂිතභාවය උදෙසා අත්‍යවශ්‍ය වේ.

සාම්ප්‍රදායික පාලි ව්‍යාකරණය උදෙසා ශ්‍රී ලාංකික පැරණි මහතෙරවරුන් විසින් කෙතරම් ගැඹුරු අවධානයක් යොමු කොට ඇද්ද යන්න ශාඛා ප්‍රශාඛා ඔස්සේ විහිද ගොස් ඇති කච්චායන මොග්ගල්ලාන යන ව්‍යාකරණ සම්ප්‍රදායන්ගෙන් මනාව පැහැදිලි වන කරුණකි. ඒවා සරල ලෙස අධුනිකයන්ට වටහා දීමට දැරූ ප්‍රත්නය පසුකාලීන ව සිංහල බසින් ලියැවී ඇති ව්‍යාකරණ කෘති ආශ්‍රයෙන් ද තේරුම් ගත හැකි ය. එතෙකුදු වුවත් පසුකාලීනව වාග්විද්‍යාව නමින් ශාස්ත්‍රයක් ඇති වීමත් සමග මෙම සාම්ප්‍රදායික ව්‍යාකරණය දෙස භාෂා පරිණාමීය ලක්ෂණ පසුබිම් කොට ගෙන හැදෑරීම් ද දියුණු වූ අතර එය වඩා ආකර්ෂණීය වූ බව ද පෙනේ. එතෙකුදු වුවත් මූලික වශයෙන් භාෂාවක් හැදෑරීමේ දී එහි සාම්ප්‍රදායික ව්‍යාකරණ රීති හඳුනා ගැනීම ද ප්‍රයෝජනවත් ය. එහෙත් විදග්ධ පුද්ගලයෙකු භාෂාවක් හැදෑරිය යුත්තේ මෙම දෙවැදෑරුම් අංග විෂයෙහි ම අවධානය යොමු කරමිනි.

විමර්ශනාත්මක පාලි ව්‍යාකරණය නැමති මෙම කෘතිය සාම්ප්‍රදායික පාලි ව්‍යාකරණය පිළිබඳ දැනුමක් ලද ආධුනික වියතුන්ගේ ඥාන සීමාවන් පුළුල් කරවීමේ අරමුණෙන් ම රචනා වූවකි. විශේෂයෙන් විශ්වවිද්‍යාලයන්හි පාලි භාෂාව හදාරන ශිෂ්‍යයන්ට මග පෙන්වීමත් ප්‍රාචීන මධ්‍යම හා අවසාන විභාග සඳහා සූදානම් වන සිසුන් මුහුණ පාන බලවත් ගැටළුවකට අල්පමාත්‍ර වශයෙන් හෝ සහනයක් සැපයීමත් මෙම කෘතියෙන් සිදුවනු ඇතැයි මම සිතමි. මෙහි දී සාම්ප්‍රදායික ව්‍යාකරණයත් ඓතිහාසික හෝ වාග්විද්‍යාත්මක ව්‍යාකරණයත් යම් පමණකට උපයෝගී කොට ගෙන ඇත. ඒ හැම ක්ෂෙත්‍රයක් කෙරෙහි ම හැඟීමක් ඉපදවීම එහි අරමුණය. මෙහි සාම්ප්‍රදායික ව්‍යාකරණයේ එන ව්‍යාකරණ සිද්ධාන්ත ඇතැම්විට විචාරයට ලක් කොට ඇත. එසේ කරන ලද්දේ සම්ප්‍රදාය ඉදිරියට රැකගෙන ආ මහතෙරවරුන් පිළිබඳ අල්පමාත්‍ර වූ නො මනාපයකින් නොව වර්තමාන වියතුන් ගණයට එකතු වන ආධුනිකයන්ගේ බුද්ධිය අවදි කරනු රිසියෙනි. යම් ලෙසකින් එකී ආධුනික වියතෙකු මෙහි ඇති කරුණුවල දොස් දකී නම් මෙහි ඵලය එය ම වේ.

බුද්ධවචනය තුළ ගැඹුරු දර්ශනයක් ඉදිරිපත් කෙරෙන හෙයින් එහි එක් අකුරක පවා වැදගත්කමක් රැඳී ඇත. එබැවින් ස්වර ව්‍යඤ්ජන සිථිල ධනිත ආදී අක්ෂර කෙරෙහි පවා සැලිකිලිමත් විය යුතු වේ. අක්ෂරයක උච්චාරණය අර්ථය කෙරේ කෙතරම් ප්‍රබල බලපෑමක් එල්ල කෙරේද යන්න පැහැදිලි කිරීමට මෙහි ඇතැම් තන්හි නිදසුන් සපයා ඇත. එහෙයින් මෙම කෘතිය පණ්ඩිත කල්පයන්ට පාලි භාෂාව පිළිබඳවත් එහි හැසිරීම් රටාව පිළිබඳව අවබෝධය දියුණු කර ගැනීමටත් සාම්ප්‍රදායික ව්‍යාකරණ රීති මෙන්ම වාග්විද්‍යාත්මක හැදෑරීම් ද ප්‍රයෝජනවත් වන අයුරු හඳුනා ගැනීමටත් උපකාර වනු ඇත.

මෙම කෘතිය රචනා කිරීමේ දී මා ව්‍යාකරණය උගත් විදුදය පිරිවෙණෙහි ගුරු උතුමන්ට ද, කැලණිය විශ්වවිද්‍යාලයේ දී මට වියරණ දැනුම ලබා දුන් හා මෙහි පසුවදනක් ලිවීමෙන් සිසු බවට සෙත් පැතූ පෙළ බස පිළිබඳ සුනිසිත දැනුමින් ලක්බිම පතළ **ඒ. ඒ. ජයසූරිය** ඇදුරුතුමන්ට ද, කළණ ගුණැති **සුමනපාල ගල්මංගොඩ** මහ ඇදුරුතුමන්ට ද ශාස්ත්‍රීය කාර්ය විෂයෙහි ආයතනික නීතිරීති පසෙක ලා සහය දෙන කොළඹ මාලිගාකන්දේ විද්‍යොදය පරිවෙණාධිපති, දර්ශනපති, රාජකීය පණ්ඩිත **බලංගොඩ සෝභිත**



**නාහිමිපාණන් වහන්සේට** ද මෙවන් කර්තව්‍යය උදෙසා කුළුණු ගුණයෙන් මා දිරිමත් කළ කැලණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය **ඔක්කම්පිටියේ පඤ්ඤාසාර** හිමිපාණන් වහන්සේට ද පරිගණක ගත කිරීමෙන් සහාය දක් වූ රාජකීය **පණ්ඩිත මතුරට පඤ්ඤානන්ද** හිමියන්ට ද පිටු සැලසුම් කළ **සාගර මහතාට** ද හරි වැරදි පිරික්සූ විද්‍යොදය පිරිවෙණේ ආචාර්ය රාජකීය පණ්ඩිත, ගෞරව ශාස්ත්‍රවේදී, **පුස්සැල්ලෑවේ ඤාණරතන හිමියන්ට** ද නන් අයුරින් සහාය දක් වූ රාජකීය පණ්ඩිත **රම්මලේ සුමනරතන, සෙනෙවිගම විමලානන්ද, සපුත්තතිරිකන්දේ නන්දරතන, ගෝණකුඹුරේ සෝභිත** යන හිමිවරුන්ට ද මාගේ නොවක් කෘතඥතාව පළ කරමි.

**මකුරුප්පේ ධම්මානන්ද හිමි**

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය
දළුගම.

2008 - 01 - 09

# පටුන


| | පිටු |
|---|---|
| පාලි ව්‍යාකරණ සම්ප්‍රදාය | 01 - 09 |
| භාෂා ව්‍යවහාරය පිළිබඳ බෞද්ධ ආකල්පය | 10 - 17 |
| පාලි භාෂාවේ වර්ණමාලාව | 18 - 24 |
| ශබ්ද විද්‍යාත්මක රීති | 25 - 33 |
| නාමපද | 34 - 41 |
| ලිඞ්ග භේදය | 42 - 45 |
| විශේෂ ශබ්ද | 46 - 54 |
| සමාස පද | 55 - 62 |
| ක්‍රියාරූපවල විවිධ භාවිත | 63 - 70 |
| පාලි භාෂාවේ විපර්යාස ලක්ෂණ | 71 - 86 |
| පාලි භාෂාවේ ක්‍රමික විකාසය | 87 - 99 |
| පාලි භාෂාව කෙරෙහි ද්‍රවිඩ භාෂාවල බලපෑම | 100 -108 |




# පාලි ව්‍යාකරණ සම්ප්‍රදාය

පාලි භාෂාවට බිහි වී ඇති ව්‍යාකරණ සම්ප්‍රදා තුනකි. **1. කච්චායන සම්ප්‍රදාය 2. මොග්ගල්ලාන සම්ප්‍රදාය 3. සද්දනීති සම්ප්‍රදාය** යනුවෙනි. පාලි හා සංස්කෘත යන භාෂාවලින් කවරක් වඩාත් පැරණි ද යන්න පිළිබඳ විවිධ මතවාද පවතින අතර ඒ පිළිබඳ නිගමනය කුමක් වුවත් පාලි ව්‍යාකරණය නම් නිසැකවම සංස්කෘත ව්‍යාකරණයෙන් ආභාසය ලබා පසුකාලීව සැකසුනක් බව කිවයුතු ය. යථෝක්ත ව්‍යාකරණ සම්ප්‍රදාය තුනෙන් ම ඒ බව පැහැදිලි වේ. පාලියට ආවේණික වූ ස්වාධීන ස්වතන්ත්‍ර ව්‍යාකරණ විභාග නැත යන්නක් මෙයින් අදහස් නොවන බව විශේෂයෙන් කිවයුතු වන්නේ අට්ඨකථාචාර්යවරුන් විසින් දක්වන ලද සංස්කෘතයට හුරු නැති විශේෂ පද විභාග නිරුක්ති කථන ක්‍රම ආදිය අටුවාවල දක්නට ලැබෙන හෙයින් හා ටීකාචාර්යවරුන් ද එය ආරක්ෂා කිරීමට උත්සහ දරා ඇති හෙයිනි. එහෙත් ලංකාවේ විසූ ව්‍යාකරණ ඇදුරන් සංස්කෘත ව්‍යාකරණ පිළිබඳ හසළ දැනුමක් ඇතිව සිටි බව කිව යුතුම වේ. එහෙයින් පාලි ව්‍යාකරණය හැදෑරිය යුත්තේ පාලියට අනන්‍ය වූ ව්‍යාකරණ සම්ප්‍රදායක් බිහි කිරීමේ අභිලාෂයෙන් ව්‍යාකරණ රීති සම්පාදනය කළ වෛයාකරණඥයන්ගේ ද සංස්කෘතය අනුව යමින් පාලියට ව්‍යාකරණ ග්‍රන්ථ බිහි කළා වූ වෛයාකරණඥයන්ගේ ද පරිශ්‍රමය පිළිබඳ සිත්හි තබාගෙන ය. ව්‍යාකරණ සම්ප්‍රදායන්ගේ ඉතිහාසය හා ඇතැම් නිර්වචන තුළින් මෙම කරුණ අනාවරණය වනු ඇත.

## කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදාය

ලංකාවේ පැරණිම ව්‍යාකරණ සම්ප්‍රදාය කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදායයි. මෙයට අයත් ප්‍රධාන කෘතිය වන කච්චායනයට '**සන්ධිකප්ප**' යන අපර නාමයක් ද වේ.[1] පඤ්චිකාප්‍රදීපයෙහි මෙය '**කච්චායනවුත්ති**' නමින් ද හඳුන්වා ඇත. පාලි ව්‍යාකරණයට හෝ කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදායට පෞරාණිකත්වයක් හා ස්වාධීනත්වයක් ලබා දෙනු රිසියෙන් දෝ මෙහි කර්තෘත්වය බුද්ධකාලීන කච්චායන මහතෙරුන්ට පවරා ඇත.[2] අංගුත්තර ටීකාවේ මහාකච්චායන හිමියන් පූර්ව ප්‍රාර්ථනා වශයෙන් කච්චායනය ද මහානිරුත්තිප්පකරණය ද නෙත්තිප්පකරණය ද යනුවෙන් ප්‍රකරණ තුනක් ප්‍රකාශ කරන ලද

බව කියවෙන හෙයින් සමහර ආචාර්යවරු මෙහි සූත්‍ර පමණක් කච්චායන තෙරුන් විසින් ප්‍රකාශ කරන ලද බවත් එහි වෘත්ති සංඝනන්දි තෙරුන් විසින් ද සම්පාදනය කරන ලද බවත් කියති. කච්චායනට නිදානයක් සේ සැලකිය හැකි කථාවක් ද වේ. ඒ අනුව එක්තරා බුඩ්ඪ පබ්බජිතයෙක් බුදුරදුන්ගෙන් 'උදයබ්බය' කම්මට්ඨානය ගෙන ගොස් අනෝතත්ත විල අසල සල් රුකක් මුල හිඳ 'උදයබ්බය' 'උදයබ්බය' (උදය-ව්‍යය) යැයි කියමින් භාවනා කරමින් සිටියේය. එවිට එම භික්ෂුව උදකයෙහි (දියෙහි) හැසිරෙන බකයෙක් දැක ඒ ගැන සිතමින් අරුත් වරදවා 'උදයබ්බය' වෙනුවට 'උදක බක' 'උදක බක' (දියෙහි කොකා) යැයි කියමින් භාවනා කළේය. මෙය දුටු බුදුන් වහන්සේ 'අර්ථය අකුරුවලින් දැනගනු ලැබේ' යන අදහස ඇති '**අත්‍ථො අක්ඛර සඤ්ඤාතො**' යන වාක්‍යය ප්‍රකාශ කළහ. මහා කච්චාන තෙරණුවෝ බුදුන් වහන්සේගේ අදහස දැන ඉහත කී 'අත්‍ථො අක්ඛරසඤ්ඤාතො' යන සූත්‍රය මුලට තබා කච්චායන ව්‍යාකරණය කළහ'යි එහි කියැවේ.[3] කච්චායනය රචනා කළ කතුවරයා පිළිබඳ විවිධ මත භේද පවතී. මෙම කච්චායන නාමය පුද්ගල නාමයක් නොව ගෝත්‍ර නාමයක් බව මලලසේකර මහතා පෙන්වා දේ. ගයිගර් මහතාට අනුව මෙකී කච්චායන කතුවරයා ක්‍රි. ව. 7 සියවස දී පමණ විසූ කෙනෙකු විය යුතුය. ඔහු විසින් ක්‍රි. ව. 1 සියවස දී සර්වවර්මන් පඬිවරයා විසින් ලියන ලද කාත්‍යායන නම් සංස්කෘත ව්‍යාකරණ ග්‍රන්ථය ද ක්‍රි. ව. 7 සියවස දී ජයාදිත්‍ය වාමන දෙදෙනා විසින් පාණිනීයට ලියන ලද කාශිකාවෘත්ති නම් විවරණය ද කච්චායන කතුවරයා විසින් ඇසුරු කොට ගන්නා ලද බව ගයිගර් විශ්වාස කරයි. කෙසේ වුවත් පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ ද කච්චායන කුතවරයා බුද්ධකාලීන කච්චායන තෙරුන් නොව පසුකාලීන කතුවරයෙකු විය යුතු බව පිළිගනිති.[4]

මෙහි පරිච්ඡේද නම් කොට ඇත්තේ 'කප්ප' නමිනි. අන්තර්ගතය තුළ එබඳු කප්ප අටක් වේ. 1. සන්ධිකප්ප 2. නාමකප්ප 3. කාරකකප්ප 4.සමාසකප්ප 5. තද්ධිතකප්ප 6. ආඛ්‍යාතකප්ප 7. කිබ්බිධානකප්ප 8. උණාදිකප්ප යනුවෙනි. එසේම මෙහි පරිච්ඡේද පහක් ද, සූත්‍ර හත්සිය දහයක් ද, අටකුරු පද ගාථා ගණනින් ගාථා එක් දහස් පන්සියයක් ද බණවර හතක් ද පද හය දහස් අටසියයක් ද, අකුරු පණස් හතර දහස් හාරසීයක් ද අන්තර්ගත වන බව කියැවේ. සාම්ප්‍රදායික ව්‍යාකරණය උගන්වන ග්‍රන්ථයක් වුවද කච්චායන



කතුවරයා පාලි භාෂාවේ භාෂාවේ ඓතිහාසික පරිණාමය පිළිබඳව මැනවින් හඳුනාගෙන සිටි බැව් පෙනේ. ඔහු 'පරසමඤ්ඤා පයොගෙ' යන සූත්‍රයෙන් සංස්කෘතයෙහි එන පාරිභාෂික නම් පාලියෙහි දු යොදා ගත යුතු බව කීය. ඒ අනුව අක්ඛර, ඝොෂ, අබ්භාස, අත්තනොපද, පාටිපදික, වුද්ධි, සබ්බධාතුක, නාම, යොග, විභාග, ලිංග, 'ආගම, ආදේශ ආඛ්‍යාත යනාදී පාරිභාෂික නාම පාලියෙහි ද යොදා ගනු ලැබිණ. තවද කච්චායන ව්‍යාකරණය සංස්කෘත කාතන්ත්‍රය ආශ්‍රය කරමින් රචනා කරන ලද බව ඒවායේ සූත්‍ර සංසන්දනයෙන් පැහැදිලිව පෙනේ.

| **කච්චායනය** | **කාතන්ත්‍රය** |
|---|---|
| යං කරොති තං කම්මං | යත් ක්‍රියතෙ තත් කර්මම් |
| යො කරොති ස කත්තා | යඃ කරොති සකර්තා |
| හෙත්‍වත්‍ථෙ ච | හෙත්‍වර්ථෙ ච |
| වාණප්පච්චෙ | වාණපත්‍යෙ |
| නාමානං සමාසො යුත්තත්‍ථො | නාමානං සමාසො යුක්තාර්ථඃ |

එහෙත් කාතන්ත්‍රයේ පමණක් නොව පාණිනී ව්‍යාකරණයේ ද ආභාසය කච්චායනයට ලැබී ඇති බව විචාරකයෝ පෙන්වා දෙති.

| **කච්චායන** | **පාණිනී** |
|---|---|
| කම්මත්‍ථෙ දුතියා | කර්මණි ද්විතීයා |
| සම්පදානෙ චතුත්‍ථී | චතුර්ථී සම්ප්‍රදානෙ |
| සො නපුංසකලිඞ්ගො | ස නපුංසකම් |

මෙබඳු සමානතා කෘතිය පුරාම දක්නා ලැබෙන හෙයින් සංස්කෘත ව්‍යාකරණයේ බලපෑම ඉතා පැහැදිලි ය. කෙසේ වෙතත් පාලියට අනුරූපී වන පරිදි කච්චායනයේ සූත්‍ර සංග්‍රහ කොට ඇති ආකාරය ඉතා ප්‍රශස්ත වේ. රාජගුරු ශ්‍රී සුභූති මාහිමියන්ට අනුව කච්චායනයට ටීකා හතරක් ද අනුටීකා දෙකක් ද පදයෝජනාවක් ද විග්‍රහ පොතක් සහ සන්න දෙකක් ද වේ.[5] ටීකාවල කච්චායනයේ ඉගැන්වෙන ව්‍යාකරණ රීති විස්තර වන අතර ටීකාවල කරුණු විස්තර

කළ ග්‍රන්ථ අනුටීකා නම් වේ. මේ හැරුණු විට කච්චායන සූත්‍රම විස්තර වන රූපසිද්ධි වැනි ග්‍රන්ථ ද කච්චායනයේ එන කරුණු ම ගාථා මාධ්‍යයෙන් විස්තර වන කච්චායන භේද වැනි කෘති ද දක්නා ලැබේ.

මුඛමත්තදීපනී "න්‍යාස" කච්චායනවුත්තිවණ්ණනා
කච්චායනසුත්තනිද්දේස (මෙය දෙවන ටීකාවයි)
කච්චායනවණ්ණනා (මෙය තෙවන ටීකාවයි)
කච්චායන ටීකා (මෙය සිව්වන ටීකාවයි විශේෂ නමක් නැත)
කච්චායන අනුටීකා (මුඛමත්තදීපනී අනුටීකාව)
නිරුත්තිමඤ්ජුසා (මුඛමත්තදීපනියේ දෙවන ටීකාවයි)
කසයින් සන්නේ (කච්චායනයේ ඉපැරණිම සිංහල සන්නයයි).
මුඛමත්තදීපනී සන්නය (19 වන සියවස ලියවුණු සන්නයකි.)
රූපසිද්ධිය (කච්චායනයේ ජනප්‍රියම පරිවාර ග්‍රන්ථයි)
රූපසිද්ධි ටීකාව
සන්දේහ විඝාතිනී (රූපසිද්ධියේ පැරණිම සන්නයයි.)
රූපසිද්ධි පුරාණ සන්නය (අනෙක් පැරණිම සන්නයයි)
බාලාවතාරය (වඩාත් සරල හා ජනප්‍රිය පරිවාර කෘතියයි.)
බාලාවතාර සුබෝධිකා ටීකා
බාලාවතාර සුගණ්ඨිසාරය
බාලාවතාර බලන සන්නය
බාලාවතාර ලියන සන්නය
බාලාවතාර ගඩලාදෙණි සන්නය
බාලාවතාර සංග්‍රහය
චූලනිරුත්තිය
අභිනව චූලනිරුත්ති සිංහල සන්නය
සද්දසාරත්ථජාලිනී
සද්දසාරත්ථජාලිනී ටීකාව
කච්චායන භේද
කච්චායන භේද ටීකා
කච්චායන සාර පුරාණටීකාව
සම්මොහනාසිනී කච්චායනසාර අභිනව ටීකාව
වාච්චවාචක ටීකා
බාලප්පබෝධිනී හා ටීකාව
සද්දබින්දු



ලීනත්ථසූදනී (සද්දබින්දු පුරාණ ටීකාව)
සද්දබින්දු අභිනවටීකා
කච්චායන විග්ගහටීකා

මෙම කෘති පෙළ ගැස්වීම නාමමාලාව හා කහටපිටියේ රාහුල හිමියන්ගේ අධ්‍යයන ආශ්‍රයෙන් කරන ලද බව නො වක්ව කිවයුතු අතර විස්තර කැමැත්තවුන් විසින් එම කෘති කියවීම වුවමනා ය. මෙම කච්චායන සම්ප්‍රදාය මීට ද වඩා අතු පතර පැතිර ගිය එකකි. ලංකාවේ පාලි භාෂාධ්‍යයනයේ දී කච්චායන සම්ප්‍රදාය අතිශය ප්‍රබල ලෙස දායක වූ බව ද සඳහන් කළ යුතු ය.

## මොග්ගල්ලාන සම්ප්‍රදාය

මොග්ගල්ලාන ව්‍යාකරණ සම්ප්‍රදාය දෙවන ව්‍යාකරණ සම්ප්‍රදායයි. මෙයට අයත් ප්‍රධාන කෘතිය වන මොග්ගල්ලායනය ක්‍රි. පූ . 1153-1186 අතර කාලයේ දී එනම් පොළොන්නරු යුගයේ මහා පරාක්‍රමබාහු සමයේ මොග්ගල්ලාන නම් තෙරනමක විසින් රචනා කරන ලදි.[6] මෙය ස්වාධීන මගක යමින් රචනා කරන ලද අංග සම්පූර්ණ කෘතියක් ලෙස සැලකේ. කච්චායනයට පසුව ලියන ලදැයි සැලකෙන මොග්ගල්ලායනය **මාගධ සද්දලක්ඛණ** යන අපර නාමයකින් ද හඳුන්වනු ලැබේ. මොග්ගල්ලායනය රචනා වන කාලය වන විට ලංකාවේ සංස්කෘත භාෂාව අතිශය දියුණු තත්වයක පැවතිණි. සංස්කෘතයේ ආදිම ව්‍යාකරණ ග්‍රන්ථය වන පාණිනී ව්‍යාකරණයත් 7 සියවස චන්ද්‍රගෝමීන් විසින් රචනා කරන ලද චාන්ද්‍ර ව්‍යාකරණයත් මොග්ගල්ලායනය සම්පාදනය කිරීමට උපයෝගී කොටගෙන ඇති බව විචාරක මතයයි. ඉතා විධිමත් නීති රීති පද්ධතියකින් සමලංකෘත සංස්කෘත ව්‍යාකරණය පිළිබඳ මනා අවබෝධයකින් එය පාලියට ගැළපෙන පරිදි අදාළ කර ගනිමින් මොග්ගල්ලාන හිමියන් විසින් මෙම කෘතිය රචනා කර ඇති බව පෙනේ. පසුකාලීන බොහෝ උගතුන්ගේ චිත්තාරාධනය කළ මොග්ගල්ලායනය ඇසුරෙන් වෙනම ගුරුකුලයක් බිහි විය. සිරිරහල් හිමියන් වැනි වියත් තෙරවරුන් අයත් වන්නේ ද මෙම පරපුරට ය.[7] මේ සම්ප්‍රදායට අයත් ව්‍යාකරණ කෘති ලෙස පහත සඳහන් කෘති හඳුනාගත හැකි ය.

1. මොග්ගල්ලායන පඤ්චිකා
2. පඤ්චිකාප්‍රදීපය

3. පදසාධනය
4. මොග්ගල්ලාන විරිත සන්නය
5. පදසාධන සන්නය
6. පදසාධන ටීකාව
7. පයොගසිද්ධිය
8. සම්බන්ධ චින්තාව
9. සම්බන්ධ චින්තා ටීකාව
10. සම්බන්ධ චින්තා පුරාණ සන්නය යනාදියයි.

## කච්චායන සම්ප්‍රදාය හා මොග්ගල්ලාන සම්ප්‍රදාය අතර වෙනස්කම්

1. කච්චායන සම්ප්‍රදායට අනුව පාලි අක්ෂර මාලාවේ ස්වර 8 කි. මොග්ගල්ලාන සම්ප්‍රදායේ ස්වර 10 කි. එ, ඔ ස්වර දෙක සම්ප්‍රදාය දෙක විසින් හ්‍රස්ව, දීර්ඝ ලෙස පිළිගැනීම මෙම වෙනසට හේතුව යි.

2. කච්චායනයේ '**වණ්ණ**' යන්නෙන් සමාන ස්වර දෙකක් ගැනේ. උදා-(ඉ, ඊ) එහෙත් මොග්ගල්ලායනට අනුව 'වණ්ණ ' යන්නෙන් අක්ෂරය යන අදහස ගැනේ. ඒ අනුව එක අකුරක් ගැනේ.

3. කච්චානයේ පාරිභාෂා සූත්‍ර නමින් සූත්‍ර විශේෂයක් වෙන් කොට දක්වා නැති අතර ඒ ඒ තැන්වලම පාරිභාෂා සූත්‍ර දක්වා ඇත. එහෙත් මොග්ගල්ලායනයේ එනමින් සූත්‍ර කිහිපයක් දක්වා ඇත.

4. කච්චායනයේ කප්ප නමින් පරිච්ඡේද 8 ඇති අතර උණාදි කප්පය අගට යෙදේ. මෙහි පරිච්ඡේද ඇත්තේ 6 ක් වන අතර ආඛ්‍යාතය අගට යෙදේ.

5. කච්චායනයේ ආඛ්‍යාතවල දී විස්තර කළ ඛ, ඡ, ස, ඊය, ආය, ණය යනාදී ප්‍රත්‍යය මෙහි කිතක කොටසෙහි ලා විස්තර කෙරේ.



6. කච්චායනයෙහි රීති විග්‍රහය උදාහරණ මූලික කොට සිදුවෙන අතර මොග්ගල්ලායනයේ සූත්‍ර ප්‍රධාන කොට පද විවරණය කෙරේ.

7. අන්තර්ගතය තුළ ද කෘති දෙකෙහි යම් යම් වෙනස්කම් දැකිය හැකි ය. නිදසුනක් ලෙස කච්චායනයේ **මදාසරෙ** යන සූත්‍රයෙන් නිග්ගහීතයට මකාරය හා දකාරය ආදේශ වන බව කියන අතර මොග්ගල්ලායනයේ **මයදාසරෙ** යන සූත්‍රයෙන් නිග්ගහීතයට ම, ය, ද, යන අක්ෂර තුනක් ආදේශ වන බව කියයි.

8. කච්චායනයේ '**සිලාඝහනුටාසපධරපිහකුධ**' යනාදී සූත්‍රයෙන් චතුර්ථී විභක්තියෙන් දක්වන ලද ප්‍රයෝග මොග්ගල්ලායනයේ ෂට්ඨී විභක්තියට අයත් ප්‍රයෝග ලෙස දක්වා ඇත.

එතෙකුදු වුවත් කච්චායනයේ හා මොග්ගල්ලායනයේ සූත්‍ර පිරික්සීමේ දී විශාල සමානත්වයක් ද පෙනේ. සමහර විට මේ කෘති දෙකේම මූලාශ්‍රය සමාන වූ හෙයින් එසේ වූවා විය හැකි ය.

| **කච්චායනය** | **මොග්ගල්ලායනය** |
|---|---|
| නිග්ගහීතං ච | නිග්ගහීතං |
| කාලද්ධානමච්චන්තසංයොගෙ | කාලද්ධානමච්චන්තසංයොගෙ |
| ණායනණානා වච්ඡාදිතො | වච්ඡාදිතොණානණායනා |
| සම්පදානෙ චතුත්ථී | චතුත්ථී සම්පදානෙ |
| සුනංහිසුච | සුනංහිසු |

මොග්ගල්ලායනය පාලි ව්‍යාකරණය හැදෑරීමෙහි ලා ඉතා ප්‍රයෝජනවත් කෘතියක් සේ සැලකෙන අතර මෙම සම්ප්‍රදායට අයත් කෘති අතර මොග්ගල්ලායන හැරුණු විට පයොගසිද්ධිය හා පද සාධනය වඩාත් ජනප්‍රියට පත් වූ බව ද පෙනේ. මෙම කෘති දෙක ලාංකික පාලි භාෂා අධ්‍යයනයේ දී විධිමත් භාෂා පරිහරණය උදෙසා සැපයූ දායකත්වය අමතක කළ නොහැක.